සිංහල ව්‍යාකරණ සම්ප්‍රදායෙහි ප්‍රථම කෘතිය වශයෙන් දඹදෙණි යුගයේ දී රචිත සිදත්සඟරාව සැලකීම පිළිබඳ විමර්ශනයක්

A study on considering the Sidat Sangarāva, composed during the Dambadeniya period, as the first work in the Sinhala grammatical tradition

ආචාර්ය දිලිනි ආරියවංශ

Abstract

According to the available evidence, Sidatsangara is considered the oldest Sinhala grammatical work. It is believed to have been written in the Dambadeniya period. While current grammarians have several views about Sinhala grammar, the ideas in Sidatsangara are being taken into consideration because it is the oldest available evidence of the Sinhala grammatical tradition. However, there are ideas about a grammatical tradition and grammatical works in Sinhala prior to Sidatsangara. This article examines how these ideas help us understand the ancient Sinhala grammatical tradition. Books on Sinhala language studies were used in this study, with the main focus on editions of Sidatsangara. Several editions were used because there were different views among editors. Some instances show that Sidatsangara quotations reflect a prior grammatical tradition. Scholars say that thÈe quotations can be considered responses to some points in a prior grammatical tradition. Sidat has been considered 'sangara' because it was compiled by collecting ideas from a prior grammatical tradition. The name of a book called 'Hela Sada Lakuna' was found in other writings, which helps to assume the existence of a prior

grammatical tradition. These points are discussed separately in this article, and it was identified that there was indeed a Sinhala grammatical tradition and grammatical works prior to Sidatsangara.

Keywords: Dambadeni period, Hela sada lakuna, Sidatsagara, Sinhala grammar, Vedeha Thero

සාරසංක්ෂේපය

විද්‍යමාන පැරණි ම සිංහල ව්‍යාකරණ ග්‍රන්ථය ලෙස සැලකෙන්නේ සිදත්සඟරාව යි. එය දඹදෙණි යුගයේ දී රචිත බව පොදු පිළිගැනීම වෙයි. සිංහල ව්‍යාකරණය සම්බන්ධයෙන් විවිධ මතවාද ඉදිරිපත් වන වර්තමානයේ වුව ද ඒ ඒ ව්‍යාකරණාංග පිළිබඳ සිදත්සඟරා මතය වෙත අවධානය යොමු කිරීම සිදු වන්නේ සිංහල ව්‍යාකරණ සම්ප්‍රදායේ පැරණිතම විද්‍යමාන සාක්ෂ්‍යය එය වන බැවිනි. එසේ වෙතත් සිදත්සඟරාවට පූර්වයෙන් ව්‍යාකරණ සම්ප්‍රදායක් පැවති බවට ද එම ව්‍යාකරණ සම්ප්‍රදාය අනුව රචිත කෘති පැවති බවට ද අදහස් ඉදිරිපත් ව තිබේ. එම මතවාදවල ස්වරූපය සහ පූර්ව ව්‍යාකරණ සම්ප්‍රදායක් පැවති බව අවබෝධ කර ගැනීමට එම අදහස්වලින් ලැබෙන පිටිවහල කවරාකාර ද? යන්න මෙම ලිපියේ දී විමසා බැලිණි. ඒ සඳහා උපයෝගි කර ගන්නා ලද්දේ සිංහල භාෂාධ්‍යයනය පිළිබඳ රචිත කෘති සහ ලිපි සමූහයක් වන අතර සිදත්සඟරා සංස්කරණ එහි දී ප්‍රධාන විය. සිදත්සඟරාවෙහි සංස්කරණ කිහිපයක් මෙහි දී ආශ්‍රය කරන ලද්දේ ඒ ඒ සංස්කාරකවරුන් ප්‍රතිවිරුද්ධ අදහස් දැරූ අවස්ථා විද්‍යමාන බැවිනි. සිදතට පූර්වයෙන් ව්‍යාකරණ සම්ප්‍රදායක් පැවති බවට, සිදත්සඟරාවෙහි ම එන පාඨවලින් පැහැදිලි වන අවස්ථා මෙහි දී දක්නට ලැබිණි. ඒ පිළිබඳ අදහස් දක්වන විද්වතුන් පෙන්වා දී ඇත්තේ පූර්ව ව්‍යාකරණ සම්ප්‍රදායක අන්තර්ගත කරුණුවලට යම් ආකාරයක ප්‍රතිචාර දැක්වීමක් ඒවායින් පිළිබිඹු වන බව ය. සිදත ‘සඟරාවක්’ ලෙස හඳුන්වන ලද්දේ ද පූර්ව ව්‍යාකරණ සම්ප්‍රදායක අදහස් සංග්‍රහ කොට ඉදිරිපත් කරන ලද බැවිනි. ‘හෙළ සද ලකුණ’ නම් ග්‍රන්ථයක් පිළිබඳ නාමමාත්‍රික

සඳහන, සිංහලයෙහි පැවති පූර්ව ව්‍යාකරණ සම්ප්‍රදායක රචනා වූ කෘතියක් පිළිබඳ අනුමානයක් ඇති කර ගැනීමට අවකාශ සලසයි. මේ සියලු කරුණු පිළිබඳ මෙහි දී වෙන් වෙන් ව විග්‍රහ කරන ලද අතර, දඹදෙණි යුගයෙහි රචිත සිදත්සඟරාවට පූර්වයෙන් සිංහල ව්‍යාකරණ සම්ප්‍රදායක් පැවති බවත් එම සම්ප්‍රදාය නියෝජනය කරමින් රචිත කෘති ද පැවති බවත් සැලකීම යුක්තියුක්ත වන බව හඳුනා ගන්නා ලදි.

ප්‍රමුඛ පදඃ දඹදෙණි සාහිත්‍ය යුගය, වෛදේහ තෙරුන්, සිංහල ව්‍යාකරණය, සිදත්සඟරාව, හෙළ සද ලකුණ

ප්‍රවේශය

දඹදෙණි සාහිත්‍ය යුගය සැලකිය හැක්කේ සිංහල ගද්‍ය සාහිත්‍යයටත් පද්‍ය සාහිත්‍යයටත් නිර්මාණ එක් වීමට අමතර ව ඡන්දස්, ව්‍යාකරණ සහ කෝෂ ග්‍රන්ථ රචනය සම්බන්ධයෙන් ද අවධානය යොමු වූ යුගයක් වශයෙනි. ඒ අනුව, සිංහල සාහිත්‍යයෙහි විවිධාංග මුල් වරට පිළිබිඹු වනුයේ දඹදෙණි යුගයෙහි ය (සන්නස්ගල, 2013, 153 පි.). අද්‍යතනයේ විද්‍යමාන පැරණි ම සිංහල ව්‍යාකරණ ග්‍රන්ථය වශයෙන් සැලකෙනුයේ මෙම යුගයේ දී රචිත සිදත්සඟරාව යි. එළු බසෙහි වියරණය පැහැදිලි කරමින් එළු බසෙන් රචිත කෘතියක් වශයෙන්, චාල්ස් ගොඩකුඹුර සිදත්සඟරාව හඳුන්වා දෙයි. එහි වියරණ රීති අදාළ වනුයේ පද්‍යකරණයෙහි නියැලෙන්නන් හට ය. පාලි, සංස්කෘත ව්‍යාකරණවලට වඩා දෙමළ ව්‍යාකරණයට සමීපත්වයක් සිදත්සඟරාවෙහි පවතින බව ගොඩකුඹුර සඳහන් කරයි (Godakubura, 2013, p. 318).

සිංහල ව්‍යාකරණාංග පිළිබඳ සිදු කෙරෙන විග්‍රහයක දී සිදත්සඟරාව වෙත ප්‍රථමයෙන් අවධානය යොමු කිරීම සාමාන්‍යයෙන් සිදු වන්නකි. සිංහල යුනිකෝඩ් හෝඩිය තෙක් සිදු වූ විකාසය විග්‍රහ කිරීමේ දී ප්‍රථමයෙන් සිදත්සඟරා හෝඩිය දැක්වීම (කෝපරහේවා, 2018, 72-81 පි.), සමාස පිළිබඳ නව විග්‍රහයක් ඉදිරිපත් කිරීමට පෙර සිදත්සඟරා මතය පෙන්වා දීම (දිසානායක, 2014, 86-87 පි.), සිංහල සන්ධි විධි විමර්ශනයේ දී

ප්‍රථමයෙන් සිදත්සඟරා විග්‍රහය ඉදිරිපත් කිරීම (කෝපරහේවා, 2014, 16-29 පි.) වැනි අවස්ථා නිදසුන් වශයෙන් දැක්විය හැකි ය. සිදත්සඟරාකරු ඉදිරිපත් කළ මතය විවේචනයට ලක් වන අවස්ථා පැවතිය ද අදාළ ව්‍යාකරණාංගය පිළිබඳ ප්‍රථම විග්‍රහය වශයෙන් එය සඳහන් කෙරේ. මෙයට හේතුව වන්නේ විද්‍යමාන පැරණි ම සිංහල ව්‍යාකරණ ග්‍රන්ථය වශයෙන් සිදත්සඟරාව සැලකීම යි. කෙසේ වෙතත්, එයට පූර්වයෙන් සිංහල ව්‍යාකරණ ග්‍රන්ථයක් නොපැවතියේ ද? යන්න වියතුන් අතර සාකච්ඡාවට භාජන වී ඇති ගැටලුවකි. මෙහි දී ප්‍රධාන අංශ තුනක් යටතේ මෙම ගැටලුව පිළිබඳ සාකච්ඡා කෙරේ.

1. සිංහලයෙහි පූර්ව ව්‍යාකරණ සම්ප්‍රදායක් පැවති බවට සිදත්සඟරාවෙන් සැපයෙන සාක්ෂ්‍ය
2. සිදත 'සඟරාවක්' ලෙස නාමීකරණය
3. 'හෙළ සද ලකුණ' යනුවෙන් ව්‍යාකරණ ග්‍රන්ථයක් පැවති බවට වන මතය

(1) සිංහලයෙහි පූර්ව ව්‍යාකරණ සම්ප්‍රදායක් පැවති බවට සිදත්සඟරාවෙන් සැපයෙන සාක්ෂ්‍ය

සිදත්සඟරාවෙහි එන ඇතැම් පාඨ, සිංහලයෙහි පූර්ව ව්‍යාකරණ සම්ප්‍රදායක් පැවති බවට සාක්ෂ්‍ය සපයයි. මේ පිළිබඳ විමසීමේ දී, විමල් ජී. බලගල්ලේ ඉදිරිපත් කරන පහත කරුණ වැදගත් වෙයි.

සිදත් සඟරාවෙහි දීර්ඝ ස්වර හා බින්දුව වර්ණ මාලාවට ඇතුළත් කිරීම, ඇ ඈ දෙක වර්ණ මාලාවෙන් බැහැර කොට තැබීම, නාම ප්‍රකෘතිවල ලිංග විභාගය ආදි ඇතැම් කරුණු සම්බන්ධයෙන් යුක්ති දක්වා ඇති සැටියෙන් පැහැදිලිව පෙනෙන්නේ ඊට කලින් රචිත කෘතියක එන වෙනස් මතවලට පිළිතුරු වශයෙන් ඒ තැන් රචිතව ඇති බවයි (බලගල්ලේ, 2016, 20-21 පි.).

සිදත්සඟරා වර්ණමාලාවට 'ඇ' සහ 'ඈ' ඇතුළත් නොවීම පිළිබඳ විවිධ හේතු දැක්වීම් පවතී. ඒ පිළිබඳ මෙහි දී විග්‍රහ කිරීම අනවශ්‍ය නමුත් ඒ අතුරෙන් එක් හේතුවක් වන්නේ සිදත්සඟරාවට පෙර පැවති ව්‍යාකරණ ග්‍රන්ථයක සඳහන් වූ අක්ෂර මාලාවක එම ස්වර ඇතුළත් නොවීම යි (පඤ්ඤාසාර හිමි සංස්., 2004, 34 පි.). එසේ ඇතුළත් නොවීම සාධාරණීකරණය සඳහා 'ඇ' වර්ණය 'අ' වර්ණයේ මාත්‍රා වෘද්ධියක් බව සඳහන් කළේ ද විය හැකි ය. දීර්ඝ ස්වර හා බින්දුව වර්ණ මාලාවට ඇතුළත් කිරීමේ දී සිදත්සඟරාකරු තබනුයේ පහත දැක්වෙන ආකාරයේ සඳහනකි.

ආ, ඊල්, ඌල්, ඒල්, ඕනා - ඈහි හුදු ව ද,
සා, සී, සූ, සේ, සෝ - ඈහි ගත් අරුණු කැරැ
උසුරුවනු හෙයින් ද ගුරුපස ද,
තමා වදන පොමින් - නො ඉකතැයි හැංගේ,
නරනිඳුහු ඉංගෙන් - සෙමෙනද නැසී පසැහී,
මෙ ඈ කව්ලැකියෙහි ද්‍රු, හංමැටි වංඇපල
ඈ ලෙව්ලැකියෙහි ද්‍රු, සපුරා උසුරුවනු හෙයින් ද මෙහි
බිඳු ද රුැසී (ඤාණාලෝක හිමි සංස්., 1971, 7 පි.)

මෙහි දී දීර්ඝ ස්වර ස්වාධීන ව සහ ගාත්‍රාක්ෂරවලට ආරූඪ ව යෙදෙන ආකාරය ගෙන හැර දක්වමින් ද කව්ලැකියෙහි සහ ලෙව්ලැකියෙහි බින්දුව යෙදෙන ආකාරය පෙන්වා දෙමින් ද සිදු කෙරෙන විග්‍රහයෙන් පිළිබිඹු වන්නේ 'දීර්ඝ ස්වර සහ බින්දුව වර්ණමාලාවට ඇතුළත් නො වේ' යන පුරාණාචාර්ය මතයක් සනිදර්ශන ව ප්‍රතික්ෂේප කෙරෙන ආකාරයකි. නාම ප්‍රකෘතිවල ලිංග විභාගයේ දී සිදත දක්වා ඇත්තේ සංස්කෘත ශාස්ත්‍රානුසාරයෙන් නාම ප්‍රකෘතිවලට ලිංග භේදයක් පවතින නමුත් ව්‍යවහාරයෙහි ස්ත්‍රීලිංග සහ පුරුෂලිංග හැර භේදයක් විද්‍යමාන නොවන බව යි.

සකුසත් අනුසෙරෙන් - ඇත ද සදනට ලිඟුබේ

නො පැනේ වහරවෙසෙසෙක් - පුමඉතිරිලිඟු දෙක විනා
(ඥානාලෝක හිමි සංස්., 1971, 67 පි.)

මෙහි දී ස්ත්‍රී සහ පුරුෂ යනුවෙන් ලිංගද්වයක් පමණක් පවතින බව දැක්වීම සිදත්සඟරාකරු ගේ ස්වාධීන මතයක් බව ඒ. ඒ. අභයසිංහ සඳහන් කරයි. සිදත්සඟරා වියරණය පද්‍යකරණය සඳහා සැපයුණක් බව ද පැරණි සිංහල පද්‍යයෙහි අප්‍රාණවාචී නාම ස්ත්‍රීලිංගයෙහි හෝ පුරුෂලිංගයෙහි හෝ වරනැගුණු බව ද ඔහු පෙන්වා දෙයි (අභයසිංහ සංස්, 1998, 132-138 පි.). සිදත්සඟරාකරුට ඒ බව විශේෂයෙන් සඳහන් කරන්නට සිදු වූයේ ඒ වන විට පැවති ව්‍යාකරණ සම්ප්‍රදායක සංස්කෘත ශාස්ත්‍රයට අනුකූල ලිංගභේදයක් අනුගමනය කරන ලද බැවින් ද විය හැකි ය.

සිදත්සඟරාවට පූර්වයෙන් සිංහලයෙහි ව්‍යාකරණ සම්ප්‍රදායක් පැවතියේ යැයි අනුමාන කළ හැකි සාක්ෂ්‍ය, උක්තාකාරයෙන් සිදත්සඟරාවෙන් ම හමු වෙයි. කිසිදු ව්‍යාකරණ සම්ප්‍රදායක් නො පැවතී කල්හි සිදත වැනි ග්‍රන්ථයක් එක් වර පහළ වීම ද අභව්‍ය ය. පූර්ව ව්‍යාකරණ සම්ප්‍රදායක් වූයේ නම් එයට අදාළ ව රචනා වූ ග්‍රන්ථ ද පැවතී අභාවයට ගියා විය හැකි ය.

(2) සිදත 'සඟරාවක්' ලෙස නාමකරණය

සිදත්සඟරාවෙහි ආරම්භක පද්‍යය මෙසේ ය.

මහද ගඳකිළි කැරැ - සව්නේ ගෙවා දත්හට,

දුහුනන් දැනුම් සඳහා - කරනෙම් සිදත්සඟරා
(ඥානාලෝක හිමි සංස්., 1971, 1 පි.)

''කතුවරයාම පවසන පරිදි සිදත 'සඟරාව'කි. එනම් වෙනත් ග්‍රන්ථයක් ඇසුරින් හෝ ආචාර්ය සම්ප්‍රදායයන් ඇසුරින් හෝ රැස් කර ගත් ව්‍යාකරණමය සිද්ධාන්තයන්ගේ සංග්‍රහයකි.''

(බලගල්ලේ, 2016, 31 පි.). ශ්‍රී සුමංගල ශබ්දකෝෂයෙහි දැක්වෙන පරිදි 'සඟරා' යන පදයට, 'සංග්‍රහය හෙවත් එකතුව', 'සත්කාරය', 'ත්‍යාගය', 'නොයෙක් කරුණු සැකෙවින් එක් කොට රචිත ග්‍රන්ථය' යන අර්ථ පවතී ('සඟරා', 1956). ඒ අනුව සිදත්සඟරාව නිර්වචනය කළ හැක්කේ සිද්ධාන්ත සැකෙවින් එක් කොට සම්පාදිත කෘතියක් වශයෙනි.

පාලියෙහි සුත්තසංගහ සහ සාරසංගහ යන ග්‍රන්ථවල 'සංගහ' යන පදයේ ඇත්තේ 'නොයෙක් කරුණු සැකෙවින් එක් කොට රචිත ග්‍රන්ථය' යන අර්ථය යි. සූත්‍රසංග්‍රහය යනු සතර බණවර උගත් පසු තව දුරටත් නිසම්දීම සඳහා උගත යුතු ධර්ම කොටස් ඇතුළත් කොට සම්පාදිත කෘතියක් වන අතර, දන්දීමේ අනුසස්, සිල් රැකීමේ අනුසස් ආදිය ද කාමයන්ගේ ආදීනවයන් ද කාමයන් දුරුකිරීමේ අනුසස් ද දැක්වීමට එහි සූත්‍ර අසූ පහක් සංගෘහිත ය. පාලි අටුවා සහ ටීකාවලින් කරුණු උපුටා ගන්නා ලද ග්‍රන්ථයක් වශයෙන් සාරසංග්‍රහය සැලකෙයි (බුද්ධදත්ත හිමි, 1966, 279-280). සිදත්සඟරා කතුවරයා තම ග්‍රන්ථය සඳහා යොදන 'කුදුසිදත' යන නාමය ද මෙහි දී වැදගත් වෙයි.

දුහුනදනහට මුත් - මෙකුදුසිදතින් වියතිනි,

පිරියත්නට නැතදතක් - මෙහි කළ මතැතැ තුස්වා

(ඥානාලෝක හිමි සංස්., 1971, 254 පි.)

මෙකී කුදුසිදත යන නාමය, ධම්මසිරි තෙරුන්ගේ කුදුසික, (පාලිඃ ඛුද්දක සික්ඛා) නම් වූ පාලි විනය පද්‍ය සංග්‍රහය හා සසඳා බැලීමෙන් මේ බව වඩාත් පැහැදිලි වනු ඇත. කුදුසික විනය මාතෘකා 50ක් උද්දේශ කොට දක්වා නිර්දේශ ප්‍රතිනිර්දේශ මුඛයෙන් හඳුන්වා දෙන පරිද්දෙන්ම කුදුසිදතෙහි කතුවරයාද වැදගත් යයි ඔහු සිතූ ව්‍යාකරණ මාතෘකා 20ක් උද්දේශ කොට දක්වා නිර්දේශ ප්‍රතිනිර්දේශ මුඛයෙන් ඒවා හඳුන්වා දෙයි (බලගල්ලේ, 2016, 31 පි.).

උක්ත අර්ථ අනුව විමසූ කල සිදත්සඟරාව ද එයට පෙර පැවති ව්‍යාකරණ ග්‍රන්ථයකින් හෝ ග්‍රන්ථ කිහිපයකින් හෝ කරුණු

උපුටා කරන ලද සංග්‍රහයක් වෙයි. මෙහි දී ප්‍රතිවිරුද්ධ ව පළ විය හැකි අදහසක් නම්, එසේ සංග්‍රහ කිරීම සඳහා කරුණු උපුටා ගන්නා ලද්දේ පාලි, සංස්කෘත සහ ද්‍රවිඩ ව්‍යාකරණ ග්‍රන්ථවලින් විනා සිංහල ව්‍යාකරණ ග්‍රන්ථයකින් නොවන බව යි. එබැවින් සිදතට පෙර සිංහල ව්‍යාකරණ ග්‍රන්ථයක් පැවතියේ යැයි ඉඳුරා ම පැවසීමට මෙය සාක්ෂ්‍යයක් නො වේ. එහෙත් සිංහලයෙහි පැවති පූර්ව ව්‍යාකරණ සම්ප්‍රදායකින් හෝ ග්‍රන්ථ කිහිපයකින් හෝ කරුණු උපුටා සැකෙවින් සංග්‍රහ කිරීමක් සිදත්සඟරාවෙහි සිදු ව ඇතැ'යි අනුමාන කිරීමට මෙම 'සඟරා' යන පදය වහල් වෙයි.

(3) 'හෙළ සද ලකුණ' යනුවෙන් ව්‍යාකරණ ග්‍රන්ථයක් පැවති බවට වන මතය

වර්තමානය වන විට අවිද්‍යමාන නමුත්, මෙනමින් සිංහල ව්‍යාකරණ ග්‍රන්ථයක් පැවති බවට වන නාමමාත්‍රික සඳහන් හමු වෙයි. වේදේහ තෙරුන් විසින් 'සීහළ සද්ද ලක්ඛණ' හෙවත් 'හෙළ සද ලකුණ' නම් කෘතියක් රචනා කරන ලද බව, එම තෙරුන් විසින් ම රචිත 'සමන්තකූට වණ්ණනා' සහ 'රසවාහිනී' යන ග්‍රන්ථවල දැක්වෙයි (බලගල්ලේ, 2016, 27 පි.).

යො'කා සීහලභාසාය සීහලං සද්දලක්ඛණං

තෙන වෙදෙහථෙරෙන කතායම්පියසීලිනා

(ඤාණවිමල හිමි සංස්., 1959, 85 පි.)

මේ අනුව, සමන්තකූට වණ්ණනාව කරන ලද්දේ සිංහල ශබ්ද ලක්ෂණය රචනා කළ වේදේහ තෙරුන් විසිනි. මෙම 'වේදේහ' යන නාමය උන් වහන්සේට ලැබුණේ විදේහ රටේ උපන් කෙනකු බැවින් විය යුතු ය. එහෙයින් එය පුද්ගල නාමයක් විය නොහැකි ය. කර්තෘ නාම ගාථාවල ඇති 'විප්පගාමවංසෙකකෙතුකො' යන යෙදුමෙන් පෙනී යන්නේ එම තෙරුන් බ්‍රාහ්මණ වංශිකයකු වූ බව යි (පියරතන හිමි, 2003, 112-127 පිටු).

යො විප්පගාම වංසෙක කෙතුභූතො තිසීහලෙ
යො'කා සීහල භාසාය සීහලං සද්දලක්ඛණං
යො ච සමන්තකූටස්ස වණ්ණනං වණ්ණයී සුභං
තෙන වෙදෙහ ථෙරෙන කතා'යං රසවාහිනී
(ඤාණවිමල හිමි සංස්., 1961, 299 පි.)

යන රසවාහිනී පාඨයෙන් පැහැදිලි වන පරිදි, සීහළ සද්ද ලක්ඛණ, සමන්තකූට වණ්ණනා සහ රසවාහිනී යන ග්‍රන්ථ තුන ම රචනා කරන ලද්දේ එක ම වේදේහ තෙරුන් විසිනි. විල්හෙල්ම් ගයිගර් හා ගුණපාල මලලසේකර සඳහන් කරන පරිදි මෙම වේදේහ තෙරුන් ක්‍රි. ව. 14 වැනි සියවසේ වාසය කොට ඇත. චාල්ස් ගොඩකුඹුර ගේ අදහස එම තෙරුන් ක්‍රි. ව. 13 වැනි සියවසේ අග භාගයේ හෝ 14 වැනි සියවසේ මුල් භාගයේ හෝ වාසය කරන්නට ඇති බව යි. ඒ අනුව මෙම වේදේහ තෙරුන් 13 වන සියවසේ අගභාගයේ, 14 වන සියවසේ මුල් භාගයේ හෝ ඊට ආසන්න කාලයක වැඩ විසූ බව නිගමනය කළ හැකිය (ධම්මවිසුද්ධි හිමි, 2013, 189-205 පිටු).

'සීහළ සද්ද ලක්ඛණ' ලෙස හඳුන්වන ලද්දේ ද සිදත්සඟරාව නම්, සිදතට පූර්වයෙන් ව්‍යාකරණ සම්ප්‍රදායක් හෝ ව්‍යාකරණ ග්‍රන්ථ හෝ පැවති බවට මේ කිසිවක් සාක්ෂ්‍ය නො වේ. සිදත්සඟරාවෙහි කර්තෘ සම්බන්ධයෙන් ද 'සීහළ සද්ද ලක්ඛණ' යනුවෙන් හැඳින්වෙන කෘතිය සම්බන්ධයෙන් ද වියතුන් අතර විවිධ මතවාද පවතී.

පුඤ්චිබණ්ඩාර සන්නස්ගල ගේ මතය අනුව, සමන්තකූට වණ්ණනා, රසවාහිනී සහ සීහළ සද්ද ලක්ඛණ යන කෘති තුන ම, පොළොන්නරු යුගයේ විසූ අරඤ්ඤායතන ආනන්ද මහා ස්ථවිරයන් ගේ ශිෂ්‍ය වේදේහ හිමි ගේ රචනා වෙයි. 'සිදත්සඟරාව' ලෙස හැඳින්වෙන්නේ ද මෙම සීහළ සද්ද ලක්ඛණය යි (සන්නස්ගල, 2013, 220 පි.). එහෙත් කුමාරතුංග මුනිදාස දක්වන පරිදි සිංහල ශබ්ද ලක්ෂණය වේදේහ හිමි ගේ රචනයක් වන අතර, සිදත්සඟරාව අනෝමදස්සි තෙරුන් ගේ රචනයකි. සිදත්සඟරාවෙහි දැක්වෙන

පරිදි එය ප්‍රතිරාජ පරිවේණාධිපති ගේ රචනයකි. මේ ප්‍රතිරාජ පරිවේණාධිපති වේදේහ හිමි ලෙස සැලකීමට කිසිදු හේතුවක් නො පෙනේ. එසේ වෙතත් එම තනතුර අනෝමදස්සී තෙරුන් විසින් දරන ලදැයි පිළිගැනීමට සාක්ෂ්‍ය පවතී. දෙවැනි පැරකුම්බා රජසමයේ ප්‍රතිරාජදේව අමාත්‍යයා විසින් තෙමහල් ප්‍රාසාදයක් කරවා අනෝමදස්සි හිමිට පුදන ලද බව මහාවංසයේ දැක්වෙයි. එබැවින් සිදත යනු අනෝමදස්සී හිමි ගේ රචනයක් වන බව කුමාරතුංග මතය යි (කුමාරතුංග සංස්., 1954, 6 පි.).

පතිරජ පිරුවන් හිමි ගේ සිදත්සඟරාවත් වේදේහ තෙරුන් ගේ සීහළ සද්ද ලක්ඛණයත් දෙකක් බව පිළිගන්නා නමුදු, පතිරජ පිරුවන් හිමි අනෝමදස්සී තෙරුන් ලෙස පිළිගැනීමට තෙන්නකෝන් එකඟ වී නැත.

දෙවන පැරකුම්බා රජු ගේ අණින් පතිරජ දෙව් සෙන්පති තෙමේ අත්තනගල්ලේ නටබුන් පස් මහල් පාය තුන් මහල් කොටැ පෙරළා කරවා අනෝමදස්සී මා හිමිපාණන් හට පිරිනමන ලද බව මහාවංසයේත් පූජාවලියේත් සඳහන් වේ... එහෙත් අත්තනගල්ලේ පිරිවෙනක් වූ බවක් හෝ අනෝමදස්සී හිමියනට පිරිවෙන් අදිපතිකමක් තිබා නමක් වත් තුබුණු බවක් හෝ සඳහන් තැනෙක් නැත්තේ යි (තෙන්නකෝන් සංස්., 1962, xi පි.).

අනවමදර්ශී හිමි ගේ 'පරෝපකාර' නම් ජ්‍යොතිෂ ග්‍රන්ථයක සඳහන් කර්තෘ නාම සන්දර්ශනය උපුටා දක්වමින් කුමාරතුංග කරන සඳහන, තෙන්නකෝන් ගේ තර්කය බිඳ හෙළන්නක් වෙයි. ප්‍රතිරාජ මහාවිහාරයෙහි නායකත්වය අනවමදර්ශී හිමිට පැවති බව එයින් දැක්වේ (කුමාරතුංග සංස්., 1954, 6 පි.).

රත්මලානේ ධර්මාරාම හිමි ගේ මතය වී ඇත්තේ සීහළ සද්ද ලක්ඛණ සහ සිදත්සඟරාව යනු එක ම ග්‍රන්ථයක් බව යි. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ගේ කාව්‍යශේඛරයෙහි එන,

නත් වරද ලොප් වන - කිරිය අදියර සත් වන

අදෙස් හැදහිලි වන - එළඳ ගුණයෙන් සදලකුණු වන

යන ශ්ලේෂාර්ථවත් පද්‍යය ආශ්‍රයෙන් ඒ බව පැහැදිලි කෙරෙන්නේ, ශබ්දලක්ෂණයට අදාළ විශේෂණ තුන ම (නත්, වරද වැනි ලෝප නිදර්ශන සහිත, ක්‍රියා අධිකාරය සත් වැනියට ඇති, හැදහිලි ආදිය ආදේශ සඳහා නිදර්ශන කොට ඇති) සිදතට සාධාරණ වන බව දක්වමිනි (බලගල්ලේ, 2016, 29-30 පිටු). එහෙත් එසේ වූ පමණින් ම 'ශබ්ද ලක්ෂණය' සහ 'හෙළ සද ලකුණ' යන පද පර්යාය ලෙස සැලකිය නොහැකි යැයි ඒ. ඒ. අභයසිංහ පවසයි. ඔහු ගේ මතය අනුව, 'සද්දලක්ඛණ' ලෙස හැඳින්වෙන්නේ තෝරා ගන්නා ලද ව්‍යාකරණ ලක්ෂණ සමූහයක් දැක්වෙන ග්‍රන්ථයකි. සිදත්සඟරාව, වීරසෝළියම් වැනි ග්‍රන්ථ එයට නිදසුන් වේ. එබැවින් රාහුල හිමි මෙහි දී 'සදලකුණු' යනුවෙන් අදහස් කර ඇත්තේ සිදත්සඟරාව විය හැකි ය. එහෙත් එය වෛදේහ තෙරුන් ගේ ශබ්ද ලක්ෂණය නොව, අනවමදර්ශී තෙරුන් ගේ ශබ්ද ලක්ෂණය විය හැකි ය. 'සද්ද ලක්ඛණ' සහ 'සදලකුණු' යන පද පර්යාය ලෙස සැලකීම අනුචිත ය. රාහුල හිමි මෙහි දී 'සදලකුණු' ලෙස සිදත්සඟරාව අදහස් කළ ද රසවාහිනී සහ සමන්තකූටවණ්ණනා කෘතිවල 'සද්ද ලක්ඛණ' යනුවෙන් සඳහන් වූයේ වෙනත් ග්‍රන්ථයක් පිළිබඳ විය හැකි ය (අභයසිංහ සංස්, 1998, xxxiii-xxxiv පිටු).

අනවමදර්ශී හිමි ගේ දෛවඥකාමධේනුවෙහි එන ඇතැම් ශ්ලෝක හා සමාන පද්‍ය සිදත්සඟරාවෙහි විද්‍යමාන බව කුමාරතුංග සහ අභයසිංහ පෙන්වා දෙන්නේ සිදත අනවමදර්ශී හිමි ගේ කෘතියක් බවට සාක්ෂ්‍යයක් වශයෙනි (කුමාරතුංග සංස්., 1954, 9-10 පිටු; අභයසිංහ සංස්., 1998, xxxii-xxxiii පිටු).

දෛවඥකාමධේනු	සිදත්සඟරාව
ප්‍රතිඵලන්ති ජගන්ති සමන්තතො	මහද ගඳකිළි කර
මහති යද්ධිෂණාමණිදර්පණෙස	විනේ ගෙවා දත් හට
ස භගවාන් මුනිරිහිතසිද්ධයෙ	දුහුනන් දැනුම් සඳහා
හෘදි චිරං මම ගන්ධකුටීයතම්	කරනෙම් සිදත් සඟරා
ඊර්ෂ්‍යාපිශාචීචපලාත්මභාජො	මෑ පෙළ පමණ සිඹී

නින්දන්ති යෙ තෙෂු මමාස්ති නාස්ථා	කිවිමන් දනන් පසසත
ආරාධකො'හං මහතාන්තු තෙෂාං	ගරහත යළි දූ කම් කිම්
යෙතු ශ්‍රමඥාශ්ච පරාර්ථකාමාඃ	පඬුවෝ මැ මෙහි පමණෝ

වේදේහ තෙරුන් පතිරාජ පිරිවෙන්පති ව විසූ බවක් සඳහන් ව නොමැති අතර, සමන්තකූට වණ්ණනාවට සහ රසවාහිනියට අනුව එම තෙරුන් අරණ්‍යවාසී හිමිනමකි. පතිරාජ පිරිවෙන සම්බන්ධ වනුයේ ග්‍රාමවාසයට ය. මේ නිසා වේදේහ හිමි ගේ හෙළ සද ලකුණ වඩා පැරණි ව්‍යාකරණ ග්‍රන්ථයක් ලෙස හඳුනා ගත හැකි වෙයි (පඤ්ඤාසාර හිමි සංස්., 2004, සං පි.). සෙනරත් පරණවිතානයන් මේ සම්බන්ධ ව දරනුයේ වෙනස් ම මතයකි.

රසවාහිනී, සමන්තකූට වණ්ණනා යන පාලි ගද්‍ය පද්‍ය ග්‍රන්ථයන්හිත් හෙළු සද ලකුණ (සීහළ සද්දලක්ඛණ) නම් සිංහල ව්‍යාකරණ ග්‍රන්ථයෙහිත් කර්තෘ වූ වේදේහ තෙරුන්, බුද්ධප්‍රිය තෙරුන්ගේ සමකාලිකයකු වූ බව සුවර්ණපුර ආනන්ද තෙරුන්ගේ අදහස විය. ආනන්ද තෙරුන් මෙම සිංහල ශබ්ද ලක්ෂණය (= හෙළු සදලකුණ) දුටු බවත්, පතිරජ පිරුවන්පතිහු විසින් සිදත් සඟරාව කරන ලද්දේ ඒ අනුසාරයෙන් බවත් සඳහන් කොට ඇත. ආනන්ද තෙරුන් කියන හැටියට නම් සිදත ලියා ඇත්තේ කෝට්ටේ යුගයෙහි හොරණ පතිරජ පිරුවන්පතිව සිටි සුමංගල තෙරුන් විසිනි. භක්තිශතක සන්නයෙහි ද කර්තෘ වූ උන්වහන්සේ තොටගමුවේ සිරිරහල් හිමියන්ගේ ශිෂ්‍යයෙකි. හොරණ පතිරජ පිරුවන ගම්පළ යුගයේ දී නිශ්ශංක අලකේශ්වරයන්ගේ මලණුවන් වූ රයිගම දේව ප්‍රතිරාජයන් විසින් කරවන ලද්දකි (බලගල්ලේ, 1983, 9-28 පිටු).

සිදත්සඟරාවෙහි කතුවරයා සම්බන්ධයෙන් ද හෙළ සද ලකුණ යනු සිදතෙන් අන්‍ය ග්‍රන්ථයක් ද නැති නම් සිදත ම ද යන කරුණ සම්බන්ධයෙන් ද නිශ්චිත නිගමනයක් ලබා ගැනීමට ප්‍රමාණවත් සාක්ෂ්‍ය නොමැති බැවින්, පූර්ව ව්‍යාකරණ ග්‍රන්ථයක් පැවති බවට ස්ථිර වශයෙන් පැවසීමට 'හෙළ සද ලකුණ' පිළිබඳ

නාමමාත්‍රික සඳහන් ප්‍රමාණවත් නො වේ. එහෙත් සිදත්සඟරාවට පූර්වයෙන් ව්‍යාකරණ ග්‍රන්ථයක් රචිත බවට අනුමානයක් ඇති කර ගැනීමට එම සඳහන් සහ ඒ ඔස්සේ ගොඩනැඟි ඇති කතිකාව වැදගත් වෙයි.

සමාලෝචනය

විද්‍යමාන පැරණි ම සිංහල ව්‍යාකරණ කෘතිය වශයෙන් සැලකෙන, දඹදෙණි යුගයෙහි රචිත බවට පොදු පිළිගැනීමක් සහිත සිදත්සඟරාව, සිංහල ව්‍යාකරණ සම්ප්‍රදායේ ආරම්භක කෘතිය නොවන බවටත් එයට පූර්වයෙන් සිංහල ව්‍යාකරණ සම්ප්‍රදායක් මෙන් ම සිංහල ව්‍යාකරණය පිළිබඳ රචිත කෘති ද පැවති බවටත් අනුමාන කිරීමට ප්‍රමාණවත් සාක්ෂ්‍ය, ප්‍රධාන අංශ තුනක් යටතේ හඳුනා ගත හැකි බව මෙහි දී සාකච්ඡා කෙරිණි. පූර්ව ව්‍යාකරණ සම්ප්‍රදායක් පැවති බවට සිදත්සඟරාවෙන් ම සැපයෙන සාක්ෂ්‍ය පළමු අංශය යි. එතෙක් පැවති යම් කරුණක් ප්‍රතික්ෂේප කොට ස්ව මතය ඉදිරිපත් කෙරෙන බවක් සිදතෙහි ඇතැම් පාඨවලින් විද්‍යමාන වෙයි. සිදත 'සඟරාවක්' ලෙස නාමකරණය දෙවැනි අංශය යි. සඟරාවක දී සිදු වන්නේ කරුණු සංග්‍රහ කිරීමක් බැවින් සිදතෙහි සැකෙවින් සංග්‍රහ වී ඇත්තේ සිංහලයෙහි පූර්ව ව්‍යාකරණ සම්ප්‍රදායක පැවති කරුණු විය හැකි ය. තෙවැනි අංශය වන්නේ 'හෙළ සද ලකුණ' නම් ව්‍යාකරණ ග්‍රන්ථයක් පිළිබඳ නාමමාත්‍රික සඳහන යි. එහෙත් මෙම අවිද්‍යමාන ග්‍රන්ථයත් සිදත්සඟරාවෙහි කර්තෘත්වයත් සම්බන්ධයෙන් විවිධ මත පවතී. එබැවින් 'හෙළ සද ලකුණ' නම් ග්‍රන්ථයක්, සිංහලයෙහි පූර්ව ව්‍යාකරණ සම්ප්‍රදායක් නියෝජනය කළ හැකි බවට ඇති කර ගත හැක්කේ අනුමානයකි.

උක්ත කරුණු මෙන් ම සිදත්සඟරාවෙහි අන්තර්ගතය ද විමසීමෙන් පැහැදිලි වන්නේ කිසිදු පූර්ව ව්‍යාකරණ සම්ප්‍රදායක පැවැත්මකින් තොර ව එවන් කෘතියක් එක් වර පහළ විය නොහැකි බව යි. එසේ පැවති සම්ප්‍රදායක, ග්‍රන්ථ රචකයන් සිටීමත් කෘති රචනා වීමත් සිදු වෙයි. මේ අනුව, සිංහල ව්‍යාකරණ සම්ප්‍රදායේ ආරම්භක කෘතිය, දඹදෙණි යුගයට පූර්ව ඉතිහාසයක් නියෝජනය කරන බව පැහැදිලි ය.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අභයසිංහ, ඒ. ඒ. (සංස්.) (1998), *ව්‍යාඛ්‍යාන සහිත සිදත් සඟරාව*, කර්තෘ ප්‍රකාශන.

කුමාරතුංග, මුනිදාස (සංස්.) (1954), *සිදත් සඟරා විවරණය*, කොළඹ: අනුල මුද්‍රණාලය.

කෝපරහේවා, සඳගෝමි (2014), *සිංහල සන්ධි අකාරාදිය*, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කෝපරහේවා, සඳගෝමි (2018), *සිංහල අකුරු පුරාණය*, නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

ඥානාලෝක හිමි, කෝදාගොඩ (සංස්.) (1971), *සිදත් සඟරා පුරාණ සන්නය*, වැලිගම: හේමචන්ද්‍ර වී. ගුණසේකර.

ඤාණවිමල හිමි, කිරිඇල්ලේ (සංස්.) (1959), *සන්න සහිත සමන්තකූට වණ්ණනා*, කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.

ඤාණවිමල හිමි, කිරිඇල්ලේ (සංස්.) (1961), *රසවාහිනී*, කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.

තෙන්නකෝන්, රා. (සංස්.) (1962), *සිදත් සඟරාව*, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

දිසානායක, ජේ. බී. (2018), *සිංහල රීතිය-8: නාම පද නිර්මාණය*, කළුබෝවිල: සුමිත ප්‍රකාශකයෝ.

ධම්මවිසුද්ධි හිමි, මඩාටුගම (2013), ''සමන්තකූට වණ්ණනාව පිළිබඳ හැඳින්වීමක්'', '*නැණැස*' වාර්ෂික ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්. රත්නපුරේ විමලජෝති හිමි සහ පෙනලබොඩ ඤාණාලෝක හිමි. මහනුවර: අස්ගිරි මහා විහාරය, 189-205 පිටු.

පඤ්ඤාසාර හිමි, ඔක්කම්පිටියේ (සංස්.) (2004), සිදත්සඟරා විමසුම, කර්තෘ ප්‍රකාශන.

පියරතන හිමි, වෑගම (2003), ''සමන්තකූට වණ්ණනා'', *වැලමිටියාවේ ශ්‍රී කුසලධම්ම ප්‍රශස්ති*, සංස්. නාවින්නේ සුගුණධම්ම හිමි, වත්තේවැව චන්දිම හිමි සහ ජූලම්පිටියේ සරණධම්ම හිමි. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 112-127 පිටු.

බලගල්ලේ, විමල් ජී. (1983), ''සිංහල සාහිත්‍ය ඉතිහාසය හා අන්තරාලීන ශිලාලිපි'', *සංස්කෘති* 17.3, සංස්. ඇස්. ජී. සමරසිංහ, අමරදාස ගුණවර්ධන සහ හැරල්ඩ් පීරිස්, 9-28 පිටු.

බලගල්ලේ, විමල් ජී. (2016), *සිංහල භාෂාධ්‍යයන ඉතිහාසය*, ද්විතීය සංස්කරණය (කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (1966), *පාලි සාහිත්‍යය*, කොළඹ: ස්වභාෂා ප්‍රකාශකයෝ.

සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර (2013), *සිංහල සාහිත්‍ය වංශය*, පුනර් මුද්‍රණය. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සොරත හිමි, වැලිවිටියේ (සංස්.) (1956), 'සඟරා', *ශ්‍රී සුමංගල ශබ්දකොෂය* - ද්විතීය භාගය, කොළඹ: අනුල මුද්‍රණාලය.

Godakubura, C. E. (2013), *Sinhalese Literature*, New Edition. Colombo: S. Godage and Brothers.